අනුර හොරේෂස්

මනමේ වේදිකා නාට්‍යය අදටත් දේශීය නාට්‍ය උද්දීපනයේ පරමාදර්ශයක් බව විචාරකයන්ගේ මතයයි. මෙම නාට්‍යය වේදිකාගත වූ වර්ෂ 1956 කාලයේ එහි පිරිවර තිස් දෙනකු පමණ විණැයි පැවසේ. මෙම කණ්ඩායමෙන් අද වන විට ජීවතුන් අතර සිටින්නේ ඉතා සුළු පිරිසකි. දේශීය නාට්‍ය වංශ කතාවේ නොමැකෙන නාම අප අතරේ ඉතිරි කරමින් මනමේ හි රගපෑ බොහෝ දෙනෙක් ජීවන රඟ මඩලට සමු දී අවසන්ය.

විදුහලේ උසස් පෙළ හදාරණ සමයේ මට සිංහල සාහිත්‍යයේ අප්‍රමාණ වූ වටිනාකම් කියා දුන් මලයාලම් ගුරුතුමා වන එම්. අයි. කුරුවිල මහතා සිහිනයෙනුත් මට පෙනෙනවා. ඔහු මට කියා දුන්නා සිංහල සාහිත්‍ය ජීවිතයට සම්බන්ධ වන ආකාරය සහ ඒ ඇසුරෙන් ජීවිතය රසවත් කර ගන්නා ආකාරය. මහාචාර්ය එදිරිවීර සරත්චන්ද්‍රයන් මට ගුරුවරයෙක් වන්නේ සරසවි සමයේදී. අනතුරුව මම සිහිනයෙන් දකින්නේ ලයනල් වෙන්ඩිට් නෘත්‍යාගාරයයි. ඉංග්‍රීසි නාට්‍ය පමණක් වේදිකා ගත කළ මෙම නෘත්‍ය ශාලාවේ ප්‍රථම සිංහල නාට්‍යය වශයෙන් 1956 නොවැම්බර් 3 වැනිදා වේදිකාගත වුණේ ඩමනමේඩ නාට්‍යයයි. නූතන සිංහල නාට්‍යයේ ආරම්භය එතැනයි. තිරය විවර වූ සැණින් පළමුවෙන්ම ප්‍රේක්ෂකයෝ දකින්නේ මාවයි. එය විශාල වාසනාවක්.

මනමේ නාට්‍යයට සහ රේඩියෝ චිත්‍රපටයට වසර 60ක් පිරීම නිමිත්තෙන් 2016 නොවැම්බර් 3 වැනිදා උපහාර උළෙලක් පැවැත්වුණා ටවර් රඟහලේදී.



මම තරුවක් නෙවෙයි - ශ්‍යාමන් ජයසිංහ

එවැනි පසුබිමක් මත ජීවිතයේ අසූ වැනි විය පසු කරන මනමේ වේදිකා නාට්‍යයේ "පොතේ ගුරා" අප සමග එක්වෙන්නේ මෙල්බන් නගරයේ සිටය. ඔහු නමින් ශ්‍යාමන් ජයසිංහයි.

කලා රසිකත්වයෙන් අනුනයකු වූ ඔබ අද මව්බිමෙන් බොහෝ ඈත්වී ගත කරන හුදකලා ජීවිතය ගැන මොනවද හිතන්නේ?
මට අතීතය ගැන හිතෙනවා. නමුත් මම අතීතයේ රැඳී ඉන්න කෙනෙක් නැහැ. මට යථාර්ථය පෙනෙනවා. ඒ හින්දා මම රැඳී ඉන්නේ අද දවසේ විතරයි. හෙටක් ගැන හිතන්නේ නැහැ. අතීතය සිහිපත් වී කිසියම් සුවයක් ලබන බව ඇත්තක්. නමුත් එය යළි ගෙන්වා ගන්න බැරි බව මම දන්නවා.

අතීත සුවයේ මතකය අතරේ පළමුවෙන් සිහියට නැගෙන්නේ කවුරුන්ද?
මගේ මතකයේ සැරිසරන මගේ ගුරුවරුන් සිහියට නැගෙනවා. මරදාන ශාන්ත ජෝශප් විද්‍යාලයේ උගන්නන්න ලැබුණු ගුරුවරු ගැන මගේ හිතේ ලොකු ගෞරවයක් තියෙනවා. ඒ ගුරුවරු ඉගැන්වීම විතරක් නෙවෙයි ජීවිතය ගැනත් අපිට උගන්වලා තිබුණා. ඒ ගුරුවරු ගැන මගේ හිතේ ලොකු ගෞරවයක් තියෙනවා. ඒ ගුරුවරු ඉගැන්වීම විතරක් නෙවෙයි ජීවිතය ගැනත් අපිට උගන්වලා තිබුණා. ඒ ගුරුවරු ගැන මගේ හිතේ ලොකු ගෞරවයක් තියෙනවා.

නමුත් එතැන ඔබ දකින්නට හිටියේ නැහැ. ඇයි ඒ?
මට ආරාධනාවක් ලැබුණේ නැහැ. මනමේ ප්‍රධාන භූමිකා රඟපෑ පිරිස අතරින් මමයි, හේමමාලියි විතරයි ජීවතුන් අතරේ අද සිටින්නේ. හේමමාලිත් අසනීපයෙන්. ඒ නිසා යුතුකමක් තිබුණා මට ආරාධනා කරන්න.

මනමේ නාටකයට සහ රේඩියෝ චිත්‍රපටයට සම්බන්ධ කලාකරුවන් එදින කැඳවා උපහාර පවත්වා මුදලින් රුපියල් ලක්ෂයක් බැගින් ප්‍රදානයක්ද අගමැති රනිල් වික්‍රමසිංහ මහතා විසින් සිදුකළ බව අපට මතකයි?
මට සල්ලිවලින් කිසිම ගිහයක් නැහැ. ආරාධනා කළා නම් මගේ අතින් ටිකට් එකක් අරගෙන හරි ලංකාවට එනවා.

මෙම උපහාර උළෙල සූදානම් කළේ අග්‍රාමාත්‍ය රනිල් වික්‍රමසිංහ මහතාගේ වුවමනාවට,ඔබට සිදුවූ අසාධාරණය සම්බන්ධයෙන් එතුමා දැනුවත් කළාද?
අගමැතිතුමා තමන්ගේ පොද්ගලික ධනය වැය කරලයි මෙම උපහාර උළෙල සිදු කළේ. අපව නොසැළකා හැරියේ මෙම උළෙල සංවිධානය කළ ටවර් රඟහලට සම්බන්ධ ආයතනයි. පසුගියදා රනිල් වික්‍රමසිංහට උපාධියක් පිරිනැමුණා මෙල්බන්හි ඩඩ්කින්ඩ සරසවියේදී. එම උළෙලට මටත් ආරාධනා ලැබුණා. එතැනදී රනිල් මාව හඳුනාගෙන මගෙන් ඇසුවා ඇයි උළෙලට ආවේ නැත්තේ? කියලා. මම කිව්වා මට ආරාධනාවක් ලැබුණේ නැහැ කියලා.

අගමැතිතුමාට තිබුණු වුවමනාව මොකක්ද මනමේ නාට්‍යයට උපහාර පුදන්න?
ඒක බොහෝ දෙනා නොදන්න කාරණාවක්. මනමේ නාටකය සම්පූර්ණයෙන් ඇතුළත් කරලා 1957 දී තැටියක් කළා. එක් තැටියක් තවමත් මා ළඟ තිබෙනවා. මෙම තැටිය නිෂ්පාදනය කළේ ඒ වනවිට මනමේ විසිපස් වතාවක් නැරඹූ රසකාවියක් වන රනිල් වික්‍රමසිංහ මහතාගේ ආදරයය මැණියන් වූ නාලනී වික්‍රමසිංහ මහත්මියයි. සමහර විට අගමැතිතුමාවත් මේ සංඛ්‍යා ලේඛන තවමත් හරිහැටි නොදන්නවා ඇති. මෙම තැටිය දොරට වැඩියේ එතුමියට අයත් කොල්ලුපිටිය පස්වැනි පටුමගේ පිහිටි නිවසේ එක් සැඳෑවකදී. මගේ අතටයි පළමු තැටිය එතුමියගේ අතින් පිරිනැමුණේ. එදින රාත්‍රී ආහාරයත් අප පිරිසට එතුමිය සූදානම් කළා. ඒ වෙනකොට රනිල් ඉතා කුඩා ළමයෙක්. අප අතරේ ඔහු ගැවසුණා. මනමේ නාටකයට උපහාර පිදීම යනු රනිල් සිය මව සිහිපත් කොට දානමය පින්කමක් සිදු කිරීමක් හා සමානයි.

ඔබ රගපෑ වෙනත් නාට්‍ය මොනවාද?
මම සහතික කරලා කියන්නම්, මම තරුවක් නෙවෙයි. මම ශ්‍රී ලංකා පරිපාලන සේවයේ ජ්‍යෙෂ්ඨ නිලධාරියෙක්. 56ඩ සමාජිය හා සංස්කෘතික පෙරළියේ ආන්දෝලනයක් සිදුකළ මනමේ නාටක කණ්ඩායමේ මෙතේ සාමාජිකයෙක්. අදත් ඔබ ඇතුළු බොහෝ දෙනා අප ගැන කතා කරන්නේ ඩමනමේඩ නාටකය හා සරත්චන්ද්‍රයන් සිහිපත් කරමින්. මම පසුව ඩඩප්මතෝ ජායතී සෝකෝ, කදා වළලුඩ නාට්‍යවලටත් රංගනයෙන් දායකත්වය ලබා දුන්නා.

45 පිටෙන්

පෙම්වතියගේ ගති සොබාද ඇට සමානද ඒ අනුව ඇඳ ඔහුට ගැළපේද වැනි කුකුසින් පිරුණු පැණයන් සහිත විසිරුණු සිතුවිලි සුමුදායකි. ඒ කෙසේ වී නමුදු, ඇඳ එහි අවසානය දකින්නේ එය සිදුවිය යුතුම හමුවීමක් ලෙසය. තමා හැරගියද, ඔහු එනතුරා ඇත තැනක මග බලා හිඳින අන් කෙනෙකු දෙසද වෛරයෙන් තොරව බලා හිඳින්නට මේ කවියේ කටහඬට හැකිවීම කොයි කවර අපහසුතා වේදනා මැද වුවද ජීවිතය පිළිබඳ ඇඳ සතු පරිණතභාවය විද්‍යමාන කරන්නකි.

ඇතැම් විට මේ කවියේ කියැවෙන කාන්තා චරිතය හා ඇඳ අතහැර විදෙස්ගත වූ ළබැඳියා අතර වූවේ ඉතා සමීප කුළුපග රහස් පෙමක් විය හැකිය. නමුත් එය සැබෑ පෙමක් බව අපට මේ වනවිටත් ඒත්තු ගැන්වී හමාරය. ඔහු සමහරවිට විදේශිකයකු විය හැකිය. තාවකාලික ලංකා ගමනකදී ඇඳ හා පෙමින් වෙළුණු තවත් එක් පෙම්වතකු විය හැක. උක්ත කොටසෙන් 'හමුවිය යුතු අය' කියා බහු අර්ථයෙන් රචිකාව කියද්දී ඉන් හැඟවෙන්නේ පෙම්වතියක් පමණක්ම නොව, දුවා දරුවන්ද ඇතුළු ඔහුගේ මුළු පවුලම විය හැක. ඒ කෙසේ වුවද ප්‍රේමය නම් ප්‍රේමය විනා අනෙකක් නොව. එය විටෙක අනියම් විය හැක. තවත් විටෙක ගිණියම් විය හැක. මෙය රහස් පෙමක් වූවා යැයි මා කියන්නට උත්සාහ කළේ ඊළඟ කවි පද තුළට එබී යාමෙන් අනතුරුවය. ඇඳ කියන්නේ හිතුණ සැණෙන් ඔවුනොවුන්ට ළං වන්නට හැකියාවක් නැති පරිදි දමා ආ නොහැකි අය වැරෙන් අත අල්ලාගෙන සිටින බවකි. ප්‍රේමයක් දලු දමා ආවද ඔහු එනතුරා මග බලා සිටින දුවා දරුවන් හෝ බිරිඳ එක පැහැර අත්හැර දැමිය නොහැකිය. ඒ බැඳුම් ඉතා දැඩිව එකිනෙකා අල්ලාගෙන සිටින අතර ජීවිතයේ අනවරත ගමන් නිමේශයන්වල විටින් විට හිත නතරවන තැන් තැන්වල සදාකාලිකව ලැගුම් ගැනීමට අපට අවසර නැත. නමුදු ඒ ඒ නිමේශයන්හි මතුවන ප්‍රේමය හිතේ රුවාගෙන ඒ මතක කරපින්නාගෙන යාම ඉබේටම වාගේ සිදුවේ. මන්ද ප්‍රේමයක් මතුවනවා නම් කෙසේ වළඳින්නද? වළලන්න හදන විටම මතුවන්නේම අමතක කළ නොහැකි මතකයන්ම නොවේද?

අවසානයේ මේ සියල්ලක්ම තෝරා ගැනීම් බව ඇඳ පවසයි; එය ඇත්තය. අපට විකල්ප මාර්ග බොහෝමයක් තිබුණද වරකට තෝරා ගත හැක්කේ එක් මගක් පමණි. සියලු සාධක ගුණ දොස් කිරා මැන අප යා යුතු මග අප තීරණය කළ යුතු වෙයි. සමහර නිමේශයන්වල අප තෝරාගන්නා දේ ජීවිතයේ තෝරාගත් හොඳම දේ නොවන්නටද පුළුවන. අඩු වැඩි වශයෙන් හරි වැරදි වෙමින් අවසානයේ මෙන්න මේ තෝරාගැනීම් අප විසින් කළ යුතුමය. මෙහි එන කාන්තාවගේ තෝරාගැනීම සියල්ල ඉවසා දරා ඇඳ ඇයිති බිම, ඒ සුන්දර මතක සමග හිඳීමත් ඔහුගේ තෝරාගැනීම තාවකාලික ප්‍රේමයක මතක පමණක් රැගෙන ඔහු ඇයිති බිමට නික්ම ගොස් ඔහු එනතුරා මග බලා හිඳින වැරෙන් අත් අල්ලාගත් දමා යා නොහැකිවුන් වෙත එළැඹීමත්ය. මේ සියලු තෝරාගැනීම් අතරින් එකක් අනෙකට වඩා හොඳ යැයි තීරණය කොට අප විසින් තෝරාගන්නේ ඒ ඒ අවස්ථාවේ අපව මෙහෙයවන අප විශ්වාස කරන කිසියම් හර පද්ධතියකට අනුගතව වන අතර ඒ කෙසේ වුව මනුෂ්‍ය ජීවිතයේ උපතින්ම ඇති අහඹු ගති ස්වභාවය අනුව ඇතැම් තෝරාගැනීම් පශ්චාත්තාපයන්ට පවා ඉඩ සදන්නට පුළුවන.

කවියේ අවසානය වෙත හැරෙන කොට මා ඉහත කියූ පශ්චාත්තාපයන්ද සියුම්ව පෙනෙන්නට ගනී. කවියේ එන කාන්තාව දමා ඔහු යන්න ගියද, සිතුණ සැණෙන් ඔහුට යළි ඇඳ සොයා ආ නොහැකි වුවද කවදා හෝ ඔහු ඇය බලා යන්නට එන විශ්වාසය ඇඳ සතුය. ඇත සමුදුරෙන් එහා තැනක ජීවිතය සනහන ඔහුට නිමේශයෙන් ඉගිල ආ නොහැකි වුවද කාලය මතින් යම් දිනක ඒ පුරුදු රුව ඇඳ අඹියස යළිත් පෙනී හිටිනු ඇතැයි යන්න ඇඳ තවමත් විශ්වාස කරන්නීය. එය ඉතා දිගු කාලයක් විය හැක; දින සති මාස නොව, අවුරුදු ගණනක්ද ඉක්මවිය හැක. ඉදින් හුස්මකින් දෙකකින්, කඳුළු බිඳු කිහිපයකින් ගෙවා දැමිය හැකි කෙටි රාත්‍රියක් නොවේ එය. හුස්ම හිරවන තුරු හඬමින් මග බලා සිටිය යුතු අවිනිශ්චිත රාත්‍රීන් සමූහයක එකතුවකි එය. එතෙක්, බලාපොරොත්තු සහ මතක පමණක් ඇඳ ජීවිත් කරනු ඇත. කවියේ මුල්ම කොටසින් කියූ මිටින් හළ දුර්වර්ණ මතක යළි යළි පෑරි පෑරි ගිණියම්ව රත් පැහැයෙන් දිදුලන්නට පටන්ගන්නේ මෙන්න මේ සංක්‍රාන්ති සමය තුළය. ඇඳ දිගින් දිගටම ඒ මතක මත්තේම මැරි මැරි ජීවිතය විඳවූවද නික්ම ගිය සුඛදාණන් වෙනුවෙන් අබ මල් රේණුවක වත් ද්වේශයෙන් තොරව බලාපොරොත්තු පෙරදැරිව ඔහු විවර කොට ගිය එක් කවුළුවකින් තව බොහෝ කාලයක් බලා හිඳීවි යැයි යන විශ්වාසය අප වෙත ගොඩනැඟී ඇත. නමුදු, ඒ සියල්ලම කාලයට බාරය.

එතෙර මෙතෙර වෙන් කරන අතරමැද පුංචි නදියක් බවට ලාණනය වූ දෙරටක් අතර විසල් සමුදුරක් අස එතෙර වීමට අමතක, එනම් එතෙර වනු නොහුණු ඇඳ සිත එදා වාගේම අදත් ඒ කලබලයෙන්ම පිරි ඇත. ඇට ඒ විසල් සමුදුරම කුඩා නදියකි. මන්ද ඇට අන් කිසිවක් විසල් නොවේ. තමා හැරදමා නික්මගිය ඔහු විනා අන් කිසිවක් මේ මොහොතේ ඇට විසල් නොවනා බැවින්ම කුඩා දිය කඩිත්තක් සේ ඇඳ හඟින මහ සමුදුර එතෙර වන්නට බැරි වීමම ඇඳ සිත විස්සෝප නංවා කලබල කරන්නේය. කිසියම් දිනක අලුත් සෑතුවක් වාගේ ඇගේ ජීවිතයට ඔහු ඇවිත් යනතුරු ඒ වේදනාවන් එකම ආකාරයෙන් රළ නගනු ඇත.

පදානුපදිකව අර්ථ නංවා ගන්නට අසීරු සංදිග්ධතා ගුණයෙන් බහුල මේ කවිය නික්මයාමක් ගැන කියූවද ඒ හා ඇලුණු බැඳුණු එක්වීම් ගැනද නොකියා කියයි. වෙන්වීම් දරා ගැනීම් හා මග බලා හිඳීම්වලට අමතරව, ඒ සියල්ලටම වඩා අන් සතුට වෙනුවෙන් කළ හැකි අත්හැරීම් ගැන මේ කවියෙන් හුවා දැක්වේ. ඒ අතින් ගත් කල මාලනී 'නික්මයාම' මැයෙන් ලියූ මේ කව තවත් ජීවිතයක ආරම්භයක් වෙනුවෙන් සියල්ල ඉවසා දරා හිඳින ගැහැනියකගේ අතතුළෙන්ම පැන නැගෙන පිටතට හඬක නොනගන සුබ පැතුමක් වාගේය. හඬක් නැතැයි මා කියූවේ ඒ සියල්ලම ඇඳ ඇතුළතින් පැන නැගෙන අභ්‍යන්තර වේදනාබර විලාපයන් බැවිනි. නමුත් එය අපේ ජීවිතවලටද කිසියම් දෙයක් ඉතුරු කරන්නේ ජීවිතයේ බොහෝ අවස්ථාවල අප කරනු ලබන තෝරාගැනීම් ගැන අපට නොපෙනෙන වෙනත් පැති මානයන්ද තිබෙන්නට පුළුවන් බවට සියුම් ජීවිතාබෝධයක් ලබා දෙමිනි. ඉදින්, නික්මයාමක් යනු නික්මයාමක් පමණක්ම දැයි යළිත් වරක් සිතා බලන්නට කිවිඳිය විසින් අපටත් කවුළුවක් හැර දී තිබේ.